# තිලොවට ගුරු වූ බුදු සමිඳු

## හය ශ්‍රේණිය -තෙවන පාඩම



සැකසුම :

පී.ඩී.එම්.පී. ද සිල්වා

ගුරු සේවය

අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

- සිදුහත් බෝසත් කුමරු බුද්ධත්වය ලබා ගැනීමේ දී බොහෝ අභියෝගයන්ට මුහුණ දී ඒවා සාර්ථකව ජය ගත්තේ ය.
- සිදුහත් කුමරු කුමරු විවාහය සඳහා ශිල්ප දැක්වීම අභියෝගයක් සේ භාරගත්තේ ය .
- වයස අවුරුදු දාසයේ දී සිදුහත් කුමරු දෙව්දහ නුවර සුප්‍රබුද්ධ රජුගේ දියණිය සමඟ විවාහ වූවේ ය.
- සිදුහත් කුමරු යශෝධරා දේවිය සමඟ ආදර්ශවත් සාර්ථක යුග ජීවිතයක් ගතකළේ ය.

# සිදුහත් කුමරු යශෝධරා දේවිය සමඟ විවාහ වීම



- එක් එක් සෘතු සඳහා රම්‍ය,සුරම්‍ය,සුභ නමින් මාලිගා තුනක් තිබුණි.
- දැසි දස්සන්ට සමානාත්මතාවයෙන් හා කරුණාවෙන් සැලකීය.
- මාලිගයේ ඒකාකාරී ජීවිතයෙන් මිදී බාහිර ලෝකය පිළිබඳ විමසිලිමත් විය.
- ඡන්න ඇමති සමඟ උද්‍යාන ක්‍රීඩා සඳහා යන අතරමග දී මහල්ලෙක්,ලෙඩෙක්,මළ කඳක් හා පැවිදි රුවක් යන සතර පෙර නිමිති දැකීය.
- සතර පෙරනිමිතිවලින් අනාවරණය කරගත් කරුණු පිළිබඳ ව හොඳින් අවබෝධ කර ගැනීම.

- රාහුල කුමරුගේ උපත සිදුවීම.

- යශෝධරා දේවිය පුතෙකු බිහිකළ පුවත ඇසූ සිදුහත් කුමරුගේ මුවින් “රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං ” (රාහුලයෙක් උපන්නා,ගිහිගෙයි බැම්මක් ඇති වුණා ) යන වාක්‍ය පිටවිය.

- කිසාගෝතමී විසින් ප්‍රකාශ කළ “නිබ්බුත පද” ඇසීමෙන් කුමරුගේ සිත තුළ නිවීම පිළිබඳ අදහසක් ඇති විය.

“නිබ්බුතා නූන සා මාතා -නිබ්බුතා නූන සෝ පිතා

නිබ්බුතා නූන සා නාරී -යස්සායං ඊදිසෝ පතී”

(මෙවන් පුතෙකු ලද මවක් ,මෙවන් පුතෙකු ලද පියෙක්,මෙවන් හිමියෙකු ලද කතක් නිසැකව ම නිවුණෝ වෙති.)

- සතර පෙර නිමිති දැකීමෙන් කලකිරීමට පත් කුමරුගේ සිත නාටිකාංගනාවන්ගේ ස්වරූපය නිසා තවත් කලකිරීමට පත්විය.
- සියලු සත්වයන්ගේ යහපත උදෙසා රජ සම්පත් හැර දමා ගිහිගෙය හැර යාමට කුමරු තීරණය කළේ ය.(එදින ඇසළ පුර පසළොස්වක පොහොය දිනයකි.)



- සියලු සැප හැර දමා ගිහිගෙය හැර යාම මහාභිනිෂ්ක්‍රමණය නම් වේ.



- ඡන්න ඇමති හා කන්ථක අසු සමඟ මාලිගයෙන් පිටවූ කුමරු අනෝමා  ගඟෙන් එතෙර ව ගංතෙරට පැමිණ ඝටීකාර මහා බ්‍රහ්මයා පූජා කළ සිවුරු පිරිකර භාරගෙන පැවිදි විය.



- පැවිදි වූ බෝසතාණන් වහන්සේ පිඬුසිඟා වැඩ පාණ්ඩව පර්වතය පාමුල දන් වළඳන බව දැනගත් බිම්බිසාර මහරජු බෝසතාණන් වහන්සේ හමුවට පැමිණියේ ය.
- පසු ව සත්‍ය සොයා වැඩම කළ බෝසතාණන් වහන්සේ පිළිවෙළින් භග්ගව, ආලාරකාලාම හා උද්දකරාමපුත්ත තවුසන් වෙත පැමිණියේ ය.
- තමන් වහන්සේ සොයන සත්‍ය එම තාපසයන්ගෙන් උගත නොහැකි බව අවබොධ කරගත් බෝසතාණන් වහන්සේ තනිව ම සත්‍ය සෙවීමට අධිෂ්ඨාන කරගත් සේක.
- නේරංජනා ගංතීරය අසල වන ලැහැබක වැඩ වසමින් ශරීරයට දැඩි දුක් දෙමින් දුෂ්කර ක්‍රියා ආරම්භ කළ සේක.
- දුෂ්කර ක්‍රියා සමයේ දී පස්වග තාපසවරු බෝසතුන්ට උපස්ථාන කළහ.

# බෝසතාණන් වහන්සේ සය වසරක් ශරීරයට දැඩි දුක් දෙමින් දුෂ්කර ක්‍රියා  කළ සේක.



- ශරීරයට දුක් දීමෙන් නිවන අවබෝධ කරගත නොහැකි බව වටහා ගත් බෝසතාණන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව ආරම්භ කළ සේක.

- මේ නිසා පස්වග තවුසෝ බෝසතුන් අත්හැර බරණැස ඉසිපතනයට ගියහ.

- වෙසක් පුරපසළොස්වක පොහොය දිනට පෙරදින අලුයම් කාලයේ උන්වහන්සේ සිහින පහක් දුටු අතර ඒවා බුද්ධත්වයට පත්වීමේ පෙරනිමිති වශයෙන් හඳුනා ගන්නා ලදී

- වෙසක් පුර පසළොස්වක පොහොය දින අජපාල නුග රුක මුල වැඩ සිටි බෝසතාණන් වහන්සේට සුජාතා සිටු දියණිය කිරිපිඩු දානය පූජා කළාය.

- සවස් කාලයේ දී  ඇසතු බෝමුල වෙත වැඩම කළ  බෝසතාණන් වහන්සේට අතරමඟ දී හමු වූ සොත්ථිය බමුණා කුසතණ අට මිටක් පූජාකළේ ය.

- කුස තණ මිටි බෝමැඩ අතුරා පැන නැඟි වජ්‍රාසනය මතබෝසතාණන් වහන්සේ  චතුරංග සමන්නාගත වීර්ය උපදවාගෙන වැඩ සිටි සේක.



# චතුරංග සමන්නාගත වීර්ය


1. ශරීරයේ සම වියළී ගියත් බුදු වී මිස මෙතැනින් නොනැගිටිමි.
2. ශරීරයේ නහර  වියළී ගියත් බුදු වී මිස මෙතැනින් නොනැගිටිමි.
3. ශරීරයේ ඇටකටු ගැළවී  ගියත් බුදු වී මිස මෙතැනින් නොනැගිටිමි.
4. ශරීරයේ මස් ලේ  වියළී ගියත් බුදු වී මිස මෙතැනින් නොනැගිටිමි.

- බෝසතාණන් වහන්සේ ආනාපානසති භාවනාව වඩමින් සිත සමාධිගත කළ සේක.
- ඉන්පසු උන්වහන්සේ ත්‍රිවිද්‍යා නම් ඥාන තුනක් උපදවා ගත් සේක.

## ත්‍රිවිද්‍යා:

- පෙර ආත්ම භාවයන් සිහිකිරීමේ නුවණ (පුබ්බේනිවාසානුස්සති ඥාණය)
- සත්වයන්ගේ උපත හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණ (චුතූපපාත ඥාණය)
- සියලු කෙලෙසුන් නැසීමේ නුවණ (ආසවක්ඛය ඥාණය)

- ත්‍රිවිද්‍යා ඥාන උපදවා ගත් බෝසතාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධ කොටගෙන මාර සේනාවන් පරදවා  වෙසක් පුර පසළොස්වක පොහොය දින සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක.



# බෝසතාණන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- විමර්ශනශීලී ව කටයුතු කිරීම.
- ඍජු තීරණ ගැනීම.
- උත්සහය අත්නොහැරීම.



# ක්‍රියාකාරකම

1. සතර පෙර නිමිති නම් කරන්න.
2. සිදුහත් කුමරු වසර කීයක් රජ සැප වින්දේ ද?
3. නිබ්බුත පද කීවේ කවුරුන් ද?
4. මහාභිනිෂ්ක්‍රමණය යනු කුමක් ද?
5. රජගහ නුවර පාලනය කළ රජු කවු ද?
6. පස්වග තවුසන් නම් කරන්න.
7. ඇසළ පොහොය දින සිදු වූ සුවිශේෂ සිදුවීම් දෙකක් ලියන්න .
8. බෝසතාණන් වහන්සේ සිත සමාධිගත කර ගැනීමට වැඩූ භාවනාව කුමක් ද?
9. ඔබගේ මවුපියන් සැනසීමට ඔබට කළ හැකි දේවල් මොනවා ද ?

# පිළිතුරු

1. මහල්ලෙක්,ලෙඩෙක්,මළ කඳක් ,පැවිදි රුවක්
2. වසර දහතුනක්
3. කිසාගෝතමී
4. සියලු සැප අත්හැර ගිහිගෙය හැර දා යාම
5. බිම්බිසාර රජතුමා
6. කොණ්ඩඤ්ඤ ,වප්ප,භද්දිය, මහානාම ,අස්සජී
7. සිදුහත් කුමරු ගිහිගෙය හැර යාම, රාහුල කුමරුගේ උපත සිදුවීම.
8. ආනාපානසති භාවනාව